www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හිටපු රැඩිකලෙක් ශ්‍රී ලංකාවේ පාලක සභාගය වෙනුවෙන් කොළඹ නගරාධිපති තනතුරු සඳහා තරග වදී

## Ex-radical stands for Colombo mayor on ticket of Sri Lankan ruling coalition

නන්ද වික්‍රමසිංහ විසිනි
2006 මාර්තු 29

ශ්‍රී ලංකාවේ එළඹෙන ප්‍රාදේශීය නගර සභා මැතිවරනවල දී එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) වෙනුවෙන් කොළඹ නගරාධිපති තනතුරු සඳහා තරග වදින වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුනේ (වාප්‍රපෙ) නායක, දිගු කාලීන මධ්‍යම පන්තික රැඩිකලෙකු වන වාසුදේව නානායක්කාරගේ අපේක්ෂකත්වය ගැන අවධානය යොමු කරනු වටනේ ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) නායකත්වයෙන් යුත් සභාගයක් වන එජනිස ජාතිකව බලයේ සිටින ආන්ඩුවයි.

පසු ගිය නොවැම්බරයේ පැවති දිවයිනේ ජනාධිපතිවරනයේ දී, වාප්‍රපෙ සමග කලින් සම්බන්ධව සිටි සංවිධාන දෙකක් වන නව සමසමාජ පක්ෂය (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප), නාමිකව ස්වාධීන අපේක්ෂකයන් ඉදිරිපත් කලේ ය. කෙසේ වෙතත්, නානායක්කාර ශ්‍රීලනිප අපේක්ෂක මහින්ද රාජපක්ෂට එකහෙලා මුක්කුව දීම පිනිස "සමාජවාදියකු" ලෙස තමන්ට පවත්නා දිරාගිය අක්තපත්‍ර යොදා ගති.

නානායක්කාර, සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායකයන් සමග එක පෙලට, රාජපක්ෂගේ මැතිවරන වේදිකාවේ පෙනී සිටියේ ය. පවත්නා සටන් විරාමයට වල කපනු පිනිස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට අවසාන නිවේදන මාලාවක් නිකුත් කරන ලෙස ජවිපෙ රාජපක්ෂගෙන් ඉල්ලා සිටි අතර, තමන් "සාම දූතයකු" බවට ශ්‍රීලනිප අපේක්ෂකයා කල විකාර කියාපෑම් වාප්‍රපෙ නායකයා අනුමත කලේ ය.

රාජපක්ෂ මැතිවරනයෙන් යන්තම් ජය ගැනීමෙන් පසුව, ඔහු සිය මැතිවරන ප්‍රකාශනය වන මහින්ද චින්තනය ක්‍රියාවට දැමීම අධීක්ෂනය කරනු පිනිස වූ විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයන්ගේ කමිටුවක සභාපති ලෙස නානායක්කාර පත් කලේ ය. මැතිවරන ව්‍යාපාරය තුල දී රාජපක්ෂ ගැන ප්‍රශස්ති ගයා තිබූ නානායක්කාරට කඩවුනු පොරොන්දු මාගල යට ගැසීමේ කාර්යය භාර කමිටුවක මුලසුන දැරීම කිසිදු අපහසුවක් නොවී ය.

නානායක්කාරට ලැබුනු පගාව වූයේ, දැනට විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) විසින් දරනු ලබන කොළඹ නගරාධිපති තනතුර සඳහා එජනිස අපේක්ෂකත්වය යි. මැතිවරන ව්‍යාපාරයට එක්ව ඇති මෙම හිටපු "සමාජවාදියා" පලාත් පාලන මැතිවරනවලට තරග වදින සෙසු සංස්ථාපිතයේ අපේක්ෂකයන්ගෙන් කිසිදු අයුරකින් වෙන් කොට හඳුනා ගත නොහැකි ය.

කොළඹ නගර සභා බල ප්‍රදේශයේ විශාල කොටස්, පිරිසිදු ජලය. විදුලි බලය සහ සෙසු සේවාවන් වැනි මූලික අත්‍යවශ්‍ය පහසුකම්වලින් තොරව බොහෝ ජනයා දරිද්‍රතාවයේ ගිලී ජීවත් වන අපිරිසිදු මුඩුක්කුවලින් යුක්ත වේ. ධනවාදයටත් ධනවතුන් හා දුගීන් අතර වැඩෙන පරතරයටත් චෝදනා එල්ල කරනවා වෙනුවට, වාප්‍රපෙ නායකයා මුඩුක්කු වාසීන්ට උපදෙස් දෙන්නේ එම කොන්දේසි පිලිගන්නා ලෙසයි.

මාර්තු 10 දා මැද කොළඹ වොක්සෝල් වීදියේ පැවති කුඩා වතු රැස්වීමක දී නානායක්කාර මෙසේ ප්‍රකාශ කලේ ය: "ධනවතුන්, මධ්‍යම පන්තිය සහ දුප්පතුන් අතර පවත්නා ආදායම් පරතරයන්ට අප අභියෝග කරන්නේ නැහැ. මෙම වෙනස්කම් තිබුනාවෙ. අපි ඉල්ලන්නෙ, මුඩුක්කුවල ජීවත් වන අයගේ කොන්දේසි ඉවසිය හැකි මට්ටමට වැඩි දියුනු කරන්න කියලා විතරයි."

නානායක්කාරට අනුව, කොළඹ නගර සභාවේ ගැටලුවල මූලය පවතින්නේ ලාභ ගරන ක්‍රමය තුල නොව, පැරනි එජාප පරිපාලනයන්ගේ දූෂනය සහ දුෂ්-කලමනාකරනය තුල ය. නගරයේ ගැටලුවලට විසඳුම ලෙස ඔහු යෝජනා කර ඇති "සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයට" පුලුල් මාධ්‍ය ආවරනයක් ලැබී ඇත.

කොළඹ "සහභාගී ප්‍රජාතන්ත්‍රවාදය" අලුත් දෙයක් නොවේ. ඒ වෙනුවට එය වනාහි එජාපය යටතේ වසර ගනනාවක් තිස්සේ ක්‍රියාවට දමා ඇති වැඩ පිලිවෙලයි. රැකියා හා සේවාවන් කප්පාදුවට ද නගර පරිපාලනයේ කොටස් පුද්ගලික ලාභ ගැරිල්ලට විවෘත කිරීමට ද "සහභාගී" වන ලෙස කම්කරුවන් සහ නගර වැසියෝ දිරිගන්වනු ලැබේ.

1999 වසරේ එක්සත් ජාතීන්ගේ වාසභූමි වාර්තාවක් "හවුල්කාරිත්වයන් සහ සහභාගිත්වය" පිලිබඳ "නව දැක්මක්" විස්තර කරයිඃ "බෙහෙත් ශාලා, මාර්ග වට රවුම්, මාර්ග ආලෝක පද්ධති, වීදි සංඥා නඩත්තු කරනු සහ දුප්පත් ජනයාට පොදු පහසුකම් සැපයීම පිනිස ආන්ඩු නොවන සංවිධාන හා පුද්ගලික අංශය සමග හවුල්කාරිත්වය, නගර සභාව විසින් තෝරා ගත් නාගරික සේවාවන් පුද්ගලීකරනය කිරීම සඵලත්වයට ද නාස්තිය අඩු කිරීම, අධීක්ෂනය හා මුදලට තිසි වටිනාකම ලැබීම යනාදි අර්ථයෙන් කාර්යක්ෂමතාවට ද තුඩු දෙයි."

සේවාවන් සැලකිය යුතු රැකියා කප්පාදු සහිතව පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට භාර දුනි. 2006 ජනවාරියේ දී, පුද්ගලීකරනය කෙරුනු කැලි කසල බැහැර කිරීමේ පද්ධතිය බිඳ වැටුනු පසුව, මහජන විරෝධයක් ද අවුලුවාලමින් නගරය මූලික අර්බුදයකට මුහුන දුන්නේ ය. නානායක්කාර හුදෙක් ප්‍රතිව්‍යුහකරන සහ පුද්ගලීකරන පිලිවෙත්වලට නව තල්ලුවක් සම්පාදනය කරනවා පමනි.

පුද්ගලික ව්‍යාපාරිකයන් නාගරික සේවාවන් පවරා ගත් කල, මධ්‍යම ආන්ඩු -- එජාප සහ ශ්‍රීලනිප යන දෙපාර්ශ්වයේ නායකත්වයෙන් යුත් ආන්ඩු -- පලාත් පාලන ආයතනවලට ලබා දෙන මුදල් ප්‍රතිපාදන කප්පාදු කොට තිබේ. වත්මන් එජනිස ආන්ඩුවට විවේචනය කරනවා වෙනුවට නානායක්කාර අඟවා ඇත්තේ තව දුර ප්‍රතිව්‍යුහකරනය සිදු කරන බවට යි. "නගර සභාව සේවාවන් නඩත්තු කිරීමට වඩා වැඩි මුදලක් ආයතනය නඩත්තු කිරීම පිනිස වැය කරන" බව ඔහු ලක්බිම පත්‍රයට පැවසී ය.

## සිංහල අන්තවාදීන් සමග සන්ධානයක්

රාජපක්ෂට නානායක්කාරගේ සහ ඔහුගේ වාප්‍රපෙ සංවිධානයේ සේවය අවශ්‍යව ඇතැයි යන්න දේශපාලන අර්බුදයේ සලකුනකි. රාජපක්ෂ පසු ගිය නොවැම්බරයේ ජනාධිපතිවරනය ජය ගත්තේ, ඡන්දදායකය වාර්ගික රේඛාවන් ඔස්සේ ද්‍රවාන්තගත කරනු පිනිස ජවිපෙ සහ තවත් සිංහල අන්තවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමය යොදා ගනිමිනි. වත්මන් සටන් විරාමය සංශෝධනය කිරීම, හමුදාව ශක්තිමත් කිරීම සහ ඊනියා සාම ක්‍රියාදාමයේ නෝර්වේජියානු පහසුකම් සපයන්නන් ඉවත් කිරීම සඳහා ජවිපෙ සහ හෙල උරුමය ඉදිරිපත් කල ඉල්ලීම් සියල්ල ම යොමු වූයේ යුද්ධය යලි ඇවිලවීම දෙසට ය.

එමෙන් ම, ජීවිත 65,000කට වඩා බිලි ගෙන ඇති 20 අවුරුදු යුද්ධය ගැඹුරු ජන විරෝධයකට ලක්ව ඇත. එබැවින් සිංහල බහුතරයේ ආරක්ෂකයා ලෙස පෙනී සිටින ගමන් ම රාජපක්ෂට තමන් සාමය සඳහා කැප වන බවට අවධාරනය කිරීමට ද සිදු විය. මෙම ප්‍රෝඩාවට යම් විශ්වාසනීයත්වයක් දෙනු පිනිස ඔහු, මහ බලවතුන්ගේ අනුග්‍රහය යටතේ සිදු කෙරුනු සාම සාකච්ඡාවලට සහාය දීමේ දීර්ඝ ඉතිහාසයක් ඇති නානායක්කාර සහ වාප්‍රපෙ දෙසට හැරුනි.

"සාම ක්‍රියාදාමය" කිසිදාක වැඩ කරන ජනතාවගේ සමාජ අවශ්‍යතා සහ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් ඉටු කිරීම පිනිස නො වී ය. ඒ වෙනුවට එහි එල්ලය වන්නේ ව්‍යාපාරිකයන්ගේ -- ශ්‍රී ලාංකික හා විදේශීය ආයෝජකයන්ගේ -- අවශ්‍යතා සඳහා සේවය කිරීම යි. එක්සත් ජනපදය සහ සෙසු මහ බලවතුන් සාකච්ඡාමය බලය බෙදා ගැනීමේ සැකැස්මක් සඳහා බල කර ඇත්තේ ශ්‍රී ලංකාවේ යුද්ධය, උප මහාද්වීපයේ, විශේෂයෙන් ම ඉන්දියාව තුල, ඔවුන්ගේ වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට වල කැපීමේ තර්ජනය මතු කරන බැවිනි.

ජනාධිපතිවරනයෙන් ඉක්බිතිව, ප්‍රචන්ඩ ප්‍රහාරවල ප්‍රතිඵලයක් ලෙස මිලිටරි භටයන්, එල්ටීටීඊ නිලධාරීන් හා සටන්කරුවන් සහ අහිංසක සිවිල් වැසියන් ඇතුලු 200කට අධික සංඛ්‍යාවක් මරනයට පත්ව ඇත. ජාත්‍යන්තර පීඩනය යටතේ, කොලඹ ආන්ඩුව සහ එල්ටීටීඊය පෙබරවාරි මස ජිනීවාහි දී වසර තුනකට ආසන්න කලකට පසුව ප්‍රථම වතාවට සාම සාකච්ඡා පැවැත්වී ය. දෙපාර්ශ්වය ම වත්මන් සටන් විරාමය පවත්වා ගෙන යන බවට පමනක් එකඟ වූ අතර රාජපක්ෂගේ සගයෝ -- ජවිපෙ සහ හෙල උරුමය -- එම ප්‍රතිඵලය ව්‍යවස්ථා විරෝධී සහ ජාතිය පාවා දීමක් ලෙස හෙලා දුටුවහ.

රාජපක්ෂ මෙම වාර්ගික අන්තවාදීන් සමග සන්ධානගතව සිටින නමුත් නානායක්කාර දිගට ම ජනාධිපති ගැන කතා කර ඇත්තේ අතිශයින් ම ප්‍රශංසාත්මක ආකාරයකිනි. මාර්තු 12 දා කොලඹ නිවහන් ප්‍රදේශයක පැවති රැස්වීමක දී, ඔහු රට යුද්ධය දෙසට ඇදී යන බවට කෙරෙන යෝජනා ප්‍රතික්ෂේප කලේ ය. "මහින්ද රාජපක්ෂ බලයට ආවම ඉක්මනින් ම යුද්ධය එන බවත් ජාතිවාදී ජන ඝාතන සිදු වන බවත් කියපු මිනිස්සු හිටිය. ඒ වුනත් ඔවුන්ගෙ දුෂ්ට බලාපොරොත්තු බිඳ වැටිල. ඔවුන්ගෙ බලාපොරොත්තු මුලුමනින් ම කඩා වැටිලා." යැයි ඔහු ප්‍රකාශ කලේ ය.

"ජනාධිපති රාජපක්ෂ රටට සාමය ගෙන ඒමට මහත් කැපවීමකින් වැඩ කරනව. ඒක නිසා මේ රටේ සියලු ම ජාතීන්ට සමානතාවයෙන් ජීවත් වීමත් ඔවුන් අතර සංහිඳියාවක් ඇති කර ගෙන රටේ ආර්ථිකය දියුනු කිරීමත් සඳහා මහින්ද චින්තනයෙන් වැඩ පිලිවෙලක් හඳුන්වා දීල තියෙනව." යනුවෙන් ද ඔහු කියා සිටියේ පලාත් පාලන මැතිවරනයේ දී එජනිසයට ඡන්දය දෙන ලෙස සභාවෙන් ඉල්ලා සිටිමිනි.

නානායක්කාර රාජපක්ෂගේ ලැජ්ජා විරහිත ක්ෂමාලාපකයකු බවට පරිවර්තනය වීම අතීතයෙන් බිඳීමක් නොව, ඔහුගේ දීර්ඝ අවස්ථාවාදී දේශපාලන ඉතිහාසයේ තාර්කික ප්‍රතිඵලය යි. ඔහුගේ කුනු ගඳ ගසන උපාමාරුවල අරටුවේ පවතින්නේ. ඔහු ශ්‍රී ලංකාවේ පාලක පන්තියේ ඒ හෝ මේ කන්ඩායමට යටත් කිරීමට නැවත නැවතත් උත්සාහ කර ඇති, කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය ප්‍රතික්ෂේප කිරීම යි. පෙර දී ඔහු පාලක ප්‍රභුවට ඔහුගේ ඇති අනුගත වීම අධිරාජ්‍ය විරෝධී හා ධනපති විරෝධී පූච්චානම්වලින් වෙස් ගැන්වීමට උත්සාහ කලේ ය. දැන් එය පවා අතහැර දමා ඇත.

නානායක්කාර සිය දේශපාලන ජීවිකාව ආරම්භ කලේ, 1964 දී සිය ට්‍රොට්ස්කිවාදී මූලධර්ම මුලුමනින් ම අතහැර දමා සිරිමා බන්ඩාරනායකගේ ධනේශ්වර ශ්‍රීලනිප සභාග ආන්ඩුවට එක් වූ ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) තරුන නායකයකු ලෙස ය. එම තීන්දුවට මුලුමනින් ම සහයෝගය දුන් නානායක්කාරට, එය අප්‍රතිපත්තික උපාමාරුවලින් හා දෙපිටකාට්ටු ගනුදෙනුවලින් ගහන දීර්ඝ ජීවිකාවක ආරම්භය විය. එයට සම කල හැකි අන් ජීවිකාවක් ශ්‍රී ලංකාවේ ර ඩිකල් දේශපාලනය නමැති ගඳ ගසන ලෝකය තුල පවා සොයා ගැනීම බොහෝ සෙයින් අසීරු ය.

නානායක්කාර, 1970 සිට 1975 දක්වා ලසසප මන්ත්‍රීවරයකු ලෙස, ජවිපෙ නායකත්වයෙන් යුත් දිවයිනේ දකුනු ප්‍රදේශවල සිංහල තරුනයන්ගේ නැගිටීමක් ලේවැකි මිලිටරි මර්දනයකට ලක් කිරීමට පූර්න වසයෙන් දායක විය. බුද්ධාගම රාජ්‍ය ආගම ද සිංහල එක ම රාජ්‍ය භාෂාව ද බවට පත් කල 1972 වාර්ගික ව්‍යවස්ථාව පැනවීමට ද ඔහු පිටුබලය දුන්නේ ය. ඔහු අද සියල්ලන් සඳහා සමානත්වය ගැන කතා කලත්, සභාග ආන්ඩුව විසින් දෙමල ජනතාවට එරෙහිව පනවන ලද වෙනස්කම් කිරීමේ සියලු ම පියවරවලට ඔහු සහාය දුන් අතර, එනයින් ගත් කල, සිවිල් යුද්ධය සඳහා පදනම සැකසීම සම්බන්ධයෙන් සෘජුව ම වගකිව යුතු ය.

නානායක්කාර ලසසපයෙන් භේද වූයේ කිසිදු ප්‍රතිපත්තිමය පදනමකින් නො වේ, 1975 දී පක්ෂය ආන්ඩුවෙන් දොට්ට දැමීමටත් පසුව ය. ලසසප කම්කරුවන් අතර, විශේෂයෙන් ම දෙමල ජනයා අතර, පුලුල්ව අපකීර්තියට පත්ව තිබූ තතු යටතේ, නානායක්කාර, තවත් ලසසප සාමාජිකයන් කන්ඩායමක් සමග එක්ව, සිය දේශපාලන අභිලාෂයන්ගේ වාහනයක් ලෙස, නව "වාම" පක්ෂයක් -- නව සමසමාජ පක්ෂය (නසසප) -- තැනීමේ ප්‍රයත්නයක යෙදුනේ ය. 1978 මැතිවරනයෙන් පසුව එජාප බලයට පත් වීමෙන් අනතුරුව, නසසප, එජාප ජනාධිපති ජේ.ආර්, ජයවර්ධනගේ විවෘත වෙලඳ පොල පිලිවෙත්වලට එරෙහිව පැන නැගි, 1980 මහා වැඩ වර්ජනයෙන් කුලුගැන්වුන, කම්කරු අරගලවලට වලකැපීමෙහි ලා තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලේ ය.

1983 සිවිල් යුද්ධය පිපිරීමේ පටන් මේ දක්වා, නසසප හා එයින් බිඳුනු කන්ඩායම් -- වාප්‍රපෙ සහ එසප -- , යුද්ධය වඩ වඩා තමන්ගේ ආර්ථික අවශ්‍යතාවන්ට වල කපන කල එල්ටීටීඊය සමග සාම සම්මුතියක් ඇති කර ගැනීමට උත්සාහ දරා ඇති පාලක ප්‍රභූවේ කන්ඩායම් සඳහා "වාම" ක්ෂමාලාපකයන් ලෙස ක්‍රියාත්මක වී තිබේ. සෑම තීරනාත්මක අවස්ථාවක දී ම, ප්‍රධාන ධනේශ්වර පක්ෂ, ඔවුන්ගේ ආශිර්වාදය පතා හා කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් වලකාලනු පිනිස, මෙමෙ රැඩිකල් සංවිධාන කරා හැරී තිබේ.

උතුරේ හා නැගෙනහිර යුද කලාපවල ඉන්දියානු හමුදා යෙදවීම ඇතුලත් සාම ගිවිසුමකට යුක්තියුක්ත භාවය ලබා ගනු වස් 1986 දී ජයවර්ධන විසින් කැඳවනු ලැබූ දේශපාලන පක්ෂවල වට මේස සාකච්ඡාවට ද නසසප සහභාගි විය. ඉන්දියානු "සාම සාධකයන්", දරුනු යුද්ධයක් අවුලුවා ගනිමින්, එල්ටීටීඊය නිරායුධ කිරීමට උත්සාහ කිරීමත් සමග, 1987 දී අත්සන් කෙරුනු ඉන්දු-ලංකා ගිවිසුම පරිපූර්න ව්‍යසනයක් බව ඔප්පු විය.

1994 දී, ශ්‍රීලනිප හා එහි ජනාධිපති අපේක්ෂිකා චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රගතිශීලී විකල්පයක් හා යුද්ධය අවසන් කිරීමේ මාවතක් නියෝජනය කරන්නේ ය යන මිථ්‍යාව තොරොම්බල් කිරීමට නසසප ක්‍රියා කලේ ය. ඇතින් සිට කුමාරතුංගට සහයෝගය දීමට අසතුටු වූ නානායක්කාර නසසපයෙන් බිඳී ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් පොදු පෙරමුනේ කොටසක් වූ ලසසපට යලි එක් විය. ඔහුට විය යුතු ලෙස ම පාර්ලිමේන්තු ආසනයකින් සංග්‍රහ කෙරුනු අතර ඔහු එම අසුන 2000 දක්වා දැරුවේ ය.

සාම ගිවිසුමක් ඇති කර ගැනීමේ කුමාරතුංගගේ ප්‍රයත්නය ඉක්මනින් ම බිඳ වැටුනු අතර නව පොදු පෙරමුනු ආන්ඩුව 1995 මැයි මස යුද්ධය උත්සන්න කලේ ය. යුද අයවැයටත් ආරක්ෂක හමුදාවන්ට පුලුල් බලතල ලබා දෙන ආන්ඩුවේ හදිසි නීති විධිවිධානවලටත් ඡන්දය දීමට නානායක්කාර කිසිසේත් පැකුලුනේ නැත. ස්වෝත්තමවාදී කැරොල් කරත්තයට ගොඩ වෙමින් ඔහු තර්ක කලේ, "යුද තත්වය පැන නැග ඇත්නම්, . . . අප එයටත් එරෙහිව සූදානම් විය යුතු" බවට යි.

යුද්ධය දිගට ඇදී යමින් ආන්ඩුව ජීවන කොන්දේසි ඉහල දැමීම හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් වර්ධනය කරන බවට දුන් පොරොන්දු බින්ද කල, මහජන අපේක්ෂා භංගත්වය හා වෛරය වැඩුනි. නානායක්කාර යලිත්

දිශාව මාරු කොට 1999 අප්‍රේල් මස ආන්ඩුවෙන් හා ලසසපයෙන් ඉවත් වී සාමයේ ප්‍රකාශකයකු ලෙස හැඩ ගැන්වී ගැනීමේ උත්සාහයක යෙදුනේ ය. ආරම්භයේ දී ඔහු සහ අලුතෙන් තනන ලද ඔහුගේ වාප්‍රපෙ, සාම සාකච්ඡා යලි ඇරඹීමේ ක්‍රමයක් ලෙස කුමාරතුංගගේ "බලය විමධ්‍යගත කිරීමේ සැලසුම්" තොරොම්බල් කලේ ය.

එහෙත් පොදු පෙරමුනේ සැලසුම පරාජයට පත් වී කුමරතුංග පාර්ලිමේන්තු සැසිය හමාර කල විට, නානායක්කාර ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවිතාවන්ට විරුද්ධ වීමේ කඩතුරාව යටතේ එජාප සමග වහා ම පෙල ගැසුනේ ය. ජාතික රූපවාහිනියේ කතා කරමින්, ඔහු සිය නව අවස්ථාවාදී හැරීම යුක්තියුක්ත කරමින් මෙසේ ප්‍රකාශ කලේ යː "නියං සමයක එක ම වතුර වලෙන් වතුර බොන වන සතුන් මෙන් අපිත් සියලු අතීත වාද භේද අමතක කර දමා ජනාධිපතිනියගේ ආඥාදායකත්වයට එරෙහිව සටන් කිරීමට ඒකාබද්ධ විය යුතු ය."

මහ ව්‍යාපාරිකයන්ගේ හා මහ බලවතුන්ගේ පීඩනය යටතේ, එජාපය, දිවයින විදේශ ආයෝජනවලට විවෘත කිරීමේ විධික්‍රමයක් ලෙස ක්‍රියාවට දමුනු "සාම ක්‍රියාදාමයේ" අද්වකාත්ලා බවට පත් විය. එවිට, නානායක්කාර, නසසප සමග එක්ව, යුද්ධය ඇරඹීමටත් එය ක්‍රියාවට දැමීමටත් සෘජුව ම වගකිව යුතු මෙම දක්ෂිනාංශික පක්ෂය, සාමයේ වාහනය ලෙස තොරොම්බල් කොට, එයට පිටුබලය දීමට ක්‍රියා කලේ ය. 2004 ජනවාරියේ දී එජාපයේ ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලට එරෙහිව නැගෙන වර්ජන හා විරෝධතා රැල්ලක් මධ්‍යයේ, නසසප හා වාප්‍රපෙ නායකයෝ එජාප නායක රනිල් වික්‍රමසිංහ පුද්ගලිකව හමු වී වැඩෙන ව්‍යාපාරය පාලනය කර ගැනීම පිලිබඳව උපදෙස් සැපයී ය.

2004 අප්‍රේල් මස එජාපයට බලය අහිමි වූ විට, විශේෂයෙන් ම පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේ ශ්‍රීලනිප අපේක්ෂකයා ලෙස රාජපක්ෂ මතු වීමෙන් පසුව, නානායක්කාර ශ්‍රීලනිප වෙත සිය පක්ෂපාතිත්වය මාරු කලේ ය. නානායක්කාර කොලඹ නගරාධිපති තනතුර දිනා ගැනීමට සමත් වුව හොත්, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කිරීමට රාජපක්ෂ ආන්ඩුව සමත් වනු ඇත යන පචය තොරොම්බල් කිරීමට ඔහු සිය තනතුර ගසා ගනු ඇත.

අන් සියල්ලටමත් වඩා, එජනිස බලයට පත් වී යන්තම් වසර දෙකකට පසුව හා රාජපක්ෂ තේරී පත් වී සිවු මසකට පසුව පැන නැගී ඇති කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා තරුනයන්ගේ වැඩෙන විරුද්ධත්වය හිර කිරීමට හා එයට වල කැපීමට ඔහු උත්සාහ දරනු ඇත. සතියකට මඳක් වැඩි කලකට ඉහත දී, ලක්ෂ ගනනක් රාජ්‍ය අංශයේ කම්කරුවෝ වැටුප් වැඩිවීමක් ඉල්ලා එක් දින වර්ජනයක යෙදුනහ. සමස්ත දේශපාලන සංස්ථාපිතයම කෙරෙහි පවත්නා තියුනු මහජන වෛරය පිලිබිඹු කරමින්, ඔවුන්ගේ වෘත්තීය සමිති කමිටුව, පලාත් පාලන මැතිවරනයේ දී සිය ඡන්දය කටු ගා දමන ලෙස තම සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. නානායක්කාර එයට ප්‍රතිචාර දක්වූයේ සුපුරුදු පල්ල ගිය පිලිවෙතිනිː එනම් අඩු නපුර ලෙස එජාපයට එරෙහිව එජනිසයට සහයෝගය දෙන්න.

රට සිවිල් යුද්ධයේ අභියස දෙදරමින් පවතිද්දී විදේශ ප්‍රාග්ධනය තව දුරටත් ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ඉල්ලා සිටිද්දී, ධනපති පන්තිය සිය අනාරක්ෂිත භාවය ගැන හොඳින් ම දනී. ජවිපෙ ඇතුලු සියලු ම ප්‍රධාන පක්ෂ වඩ වඩා අපකීර්තියට ලක්ව ඇති තතු යටතේ, නානායක්කාර යලිත් සේවය සඳහා කැඳවනු ලැබ ඇත. ඔහුගේ නම එජනිස අපේක්ෂක ලැයිස්තුවේ පැවතීම කොලඹ හා දිවයින පුරා කම්කරු පන්තිය සඳහා සූදානම් කර ඇත්තේ කුමක් ද යන්න පිලිබඳ තියුනු ම අනතුරු ඇඟවීම යි. සාමය හා සෞභාග්‍යය ගෙන එනවා වෙනුවට, රාජපක්ෂ ආන්ඩුව කරන්නේ එහි ප්‍රතිවිරුද්ධය යි.

© www.wsws.org